# කලණ අධ්‍යාපන ආයතනය

නො. 820, ගැමුණු මාවත, හෝමාගම ::: 0112891169 ::: 0777007260


## 2024 සාහිත්‍ය මාසය සැමරීම වෙනුවෙන් පවත්වනු ලබන කෙටිකතා තරඟාවලිය

- ### අරමුණ:

කලණ අධ්‍යාපන ආයතනය, එහි මුඛ්‍ය පරමාර්ථය වන දැනුමෙන්, හැකියාවෙන් සහ මනුෂ්‍යත්වයෙන් පිරි නිර්මාණශීලී දරු දැරියන් ලොවට දායාද කිරීමේ ක්‍රියාවලියේ තවත් අදියරක් ලෙස 2024 එළඹෙන සාහිත්‍ය මාසය නිමිති කොට ගෙන සංවිධානය කරනු ලබන කෙටිකතා තරඟයේ අරමුණ වන්නේ ශ්‍රී ලංකාවේ පාසල් සිසු දරු දැරියන්ගේ විෂය සමගාමී දැනුම සහ ආකල්ප සංවර්ධනයට අත්වැලක් සැපයීමත්, ඔවුන්ගේ ලිවීමේ, සිතීමේ සහ තම අදහස් ප්‍රකාශ කිරීමේ හැකියාව වර්ධනය කිරීම සහ ඔවුන්ගේ භාවමය හැකියාවන් අවදිකිරීම මඟින් හැකියාවෙන් පිරි වැඩදායී පුරවැසියන් නිර්මාණය කිරීමයි.

- ### තරඟ විස්තර:

පහතින් සඳහන් කොට ඇති වයස් කාණ්ඩ දෙක යටතේ දූ පුතුන් හට තම නිර්මාණ ඉදිරිපත් කළ හැකිය. සීමිත පහසුකම් යටතේ සංවිධානය කරනු ලබන්නක් බැවින් **<u>කෙටිකතා තරඟාවලිය සිංහල භාෂාවෙන් පමණක්</u>** පවත්වනු ලැබේ.

### කෙටිකතා තරඟය:

| **කාණ්ඩය** | **වචන ප්‍රමාණය** |
|---|---|
| කනිෂ්ඨ අංශය - 6, 7, 8 සහ 9 ශ්‍රේණි | ඔබගේ කෙටිකතාව ඔබ කැමති ඕනෑම ප්‍රස්තුතයක් (පරිකල්පනයක්, අත්දැකීමක්) යටතේ ඉදිරිපත් කළ හැකි අතර වචන සංඛ්‍යාව 4000 ට නොවැඩි විය යුතුය. |
| ජ්‍යෙෂ්ඨ අංශය - 10, 11, 12 සහ 13 ශ්‍රේණි | ඔබගේ කෙටිකතාව ඔබ කැමති ඕනෑම ප්‍රස්තුතයක් (පරිකල්පනයක්, අත්දැකීමක්) යටතේ ඉදිරිපත් කළ හැකි අතර වචන සංඛ්‍යාව 6000 ට නොවැඩි විය යුතුය. |

- ### තරඟ කොන්දේසි:

  - කෙටිකතා තරඟය සඳහා ඉහත වයස් කාණ්ඩ අනුව ඕනෑම දරුවකුට හෝ දැරියකට සහභාගී විය හැකියි.
  - එක් අයෙකුට ඉදිරිපත් කළ හැක්කේ එක් නිර්මාණයක් පමණි.
  - තරඟකරුවා හෝ තරඟකාරිය තම නිර්මාණය තම අත් අකුරින් පැහැදිලිව **<u>ෆුල්ස් කැප් කඩදාසි</u>** වල පමණක් ලිවිය යුතු අතර වචන ප්‍රමාණය ඉහත සඳහන් පරිදි විය යුතුය.

    මීට අමතරව එම නිර්මාණය සුදුසු පරිදි පරිගණක ගත කොට නම සහ තරඟ අංශය සටහන් කොට මෘදු පිටපත් MS Word **<u>සහ</u>** PDF යන ගොනු ආකාර වලින් 0777007260 අංකයට Whatsapp කිරීම සිදු කළ යුතුයි.
  - ආදර්ශ ආකෘති පත්‍රය අනුව අයදුම් පත්‍රය සකස් කර එහි අඩංගු කරුණු සම්පූර්ණ කර අත්සන් කොට තම පංතිභාර/ විෂයභාර ගුරුවරයා සහ විදුහල්පතිතුමා/ තුමිය ලවා සහතික කොට තම නිර්මාණයට අමුණා ඉදිරිපත් කල යුතුය.
  - තම හැකියාවන් ස්වතන්ත්‍ර නිර්මාණයක් විය යුතු අතර, එය තමන්ගේම නිර්මාණයක් බව සනාථ කිරීම සඳහා තම පන්ති භාර ගුරුවරයා ඒ බවට නිර්මාණයේ පහතින් හෝ පිටුපස තම අත්සන යොදා නිර්දේශ කල යුතු අතර තම පාසලේ විදුහල්පති/ විදුහල්පතිනිය විසින් එය තම අත්සන යොදා සහතික කර තිබිය යුතුය.

- තමා විසින් ඉදිරිපත් කරනු ලබන නිර්මාණ සුදුසු ලෙස කවරයක දමා හෝ සුදුසු දවටනයකින් දවටා සකස් කිරීමෙන් අනතුරුව එම කවරයේ හෝ දවටනයෙහි වම් පස ඉහල කෙලවරේ **"2024 සාහිත්‍ය මාස තරඟ - කෙටිකතා - කනිෂ්ඨ / ජ්‍යෙෂ්ඨ අංශය"** යනුවෙන් සඳහන් කල යුතුය.

- ඉහත සඳහන් පරිදි සකස් කල සියළුම නිර්මාණ වරක හේමාංග සතරසිංහ, කලණ අධ්‍යාපන ආයතනය, නො. 820, ගැමුණු මාවත, හෝමාගම. යන ලිපිනය වෙත **2024 සැප්තැම්බර් මස 15 වන දිනට හෝ ඊට ප්‍රථමව** ලැබෙනසේ එවිය යුතු අතර ඒවා ගෙනැවිත් භාරදීම ද සිදුකළ හැකියි. එදිනට පසුව එවනු ලබන නිර්මාණ තරඟය සඳහා භාරගනු නොලැබේ.

- පළමු, දෙවන සහ තෙවන ස්ථාන ලබාගන්නා දූ පුතුන් එක් එක් කාණ්ඩ යටතේ තෝරාගනු ලබන අතර ජයග්‍රාහී තරඟකරුවන්/ තරඟකාරියන් හට විද්‍යුත් සහතික පත් (eCertificates) හා වටිනා ත්‍යාග ලබා දෙනු ලැබේ. මෙයට අමතරව සිවු වන ස්ථානයේ සිට අට වන ස්ථානය දක්වා කුසලතා ස්ථාන පහක් තෝරාගනු ලැබේ. එම දූපුතුන් හට විද්‍යුත් සහතික පත්‍ර සහ සැනසිලි ත්‍යාග නිකුත් කරනු ලැබේ. තව දුරටත් මෙම තරඟාවලිය සඳහා සහභාගී වන සියළුම දූ පුතුන් සඳහා සහභාගීත්වය වෙනුවෙන් විද්‍යුත් සහතිකපතක් නිකුත් කරනු ලැබේ.

- ජයග්‍රහණය කරනු ලබන දූ පුතුන්ගේ නිර්මාණ දුලබ රුසියානු සාහිත්‍ය කෘති සඳහා සකස් කර තිබෙන 'සඳ කිරණ' වෙබ් අඩවියේ අන්තර් ගතයට එක් කරනු ඇත.

- මෙම තරඟ සම්බන්ධයෙන් අවසාන තීරණය හෝමාගම කලණ අධ්‍යාපන ආයතනයේ නිලධාරී මඩුල්ල සතු වේ.

- වැඩි දුර විස්තර සඳහා,

  0777007260 - වරක සතරසිංහ

# 2024 සාහිත්‍ය මාසය සැමරීම වෙනුවෙන් පවත්වනු ලබන කෙටිකතා තරඟාවලිය

## ආදර්ශ අයදුම් පත්‍රය

| අයදුම්කරුගේ තොරතුරු | | | |
|---|---|---|---|
| සහතික පත්‍රය නිකුත්කළයුතු නම | | | |
| පෞද්ගලික ලිපිනය | | | |
| උපන්දිනය | | වයස | |
| පාසලේ නම සහ ලිපිනය | | ශ්‍රේණිය | |
| | | පාසලේ දුරකථන අංකය | |
| **ඇමතුම් විස්තර** | | | |
| නිවසේ දුරකථන අංකය (ස්ථාවර ) | | WhatsApp සහිත ජංගම දුරකථන අංකය | |
| **සහභාගී වන තරඟය පිළිබඳ විස්තර** | | | |
| තරඟය | කෙටි කතා | තරඟ කාණ්ඩය | කනිෂ්ඨ / ජ්‍යෙෂ්ඨ |
| **සහතික වීම** | | | |

මේ සමග අමුණා ඉදිරිපත් කරන නිර්මාණය මගේම නිර්මාණයක් බවත් එය අදාල තරඟ කොන්දේසි වලට එකඟව ඉදිරිපත් කරන බවත් ඉහත සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් ප්‍රකාශ කර සිටිමි.

| | |
|---|---|
| ........................................................<br>දිනය | ........................................................<br>ශිෂ්‍යයාගේ/ ශිෂ්‍යාවගේ අත්සන |

මේ සමග අමුණා ඉදිරිපත් කරන නිර්මාණය ඉහත විස්තර සඳහන් ශිෂ්‍යාගේ/ ශිෂ්‍යාවගේ ස්වතන්ත්‍ර නිර්මාණයක් බවත් ඇය/ ඔහු ඉදිරිපත් කර ඇති තොරතුරු සත්‍ය සහ නිවැරදි බවත් සහතික කරමි.

| | |
|---|---|
| ........................................................<br>දිනය | ........................................................<br>පංතිභාර/විෂය භාර ගුරුතුමාගේ/ ගුරුතුමියගේ අත්සන |
| ........................................................<br>දිනය | ........................................................<br>විදුහල්පතිතුමාගේ/ තුමියගේ අත්සන ( නිල මුද්‍රාව ) |